# රූපවාහිනී මාධ්‍ය තුළ විකාශය වන වාස්තු විද්‍යාත්මක වැඩසටහන් වල ස්වභාවය පිළිබඳ  අධ්‍යයනයක්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***ඩබ්.එච්.ඩී.එරන්දිකා ප්‍රනාන්දු***[1]
***දිනිති ජයසේකර***[2]

සංක්ෂේපය

කෘෂි නිෂ්පාදන ආර්ථික ක්‍රියාවලිය තුළ වගා කිරීමේදීත්, නිෂ්පාදන අලෙවිකිරිමේදීත්, පරිභෝජනය කිරීමේදිත්, යම් යම් ගැටලු උද්ගත කරන බව එදිනෙදා සාකච්ඡාවන්හීදී වාර්තා වේ. විශේෂයෙන්ම වී වගාවේදී සහ අලෙවිකිරීමේදී ගොවියාත් සහල් මිලදී ගැනීමේදී පාරිභෝගිකයාත් විවිධ ගැටලුවලට මුහුණ දෙයි. එනම් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම තුළ ඒවා එකිනෙකට නොගැලපෙන බව පූර්ව පර්යේෂණ තුළින් අනාවරණය කරඇත. මෙම අධ්‍යයනයට පාදක වූ මූලික ගැටලුව වන්නේ වී මිලදී ගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී ගැටලු උද්ගත කරනු ලබන්නේද? එසේනම් ඒ මොනවාද යන්න හඳුනා ගැනීමයි. එහිදී වී ගොවිතැන මහා පරිමාණයෙන්  සිදු කරන දිස්ත්‍රික්ක අතුරින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 231 සඳගලතැන්න ග්‍රාම නිළධාරී වසම අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරා ගැණිනි. අධ්‍යයනයේ නියැදිය වශයෙන් අහඹු ලෙස තෝරාගත් පවුල් සියයක් ඇතුළත් වූ අතර ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මගින් ප්‍රාථමික දත්ත සහ තොරතුරු සපයා ගැණිනි. එමෙන්ම ලබා ගත් ඇතැම් තොරතුරු නිරීක්‍ෂණ මගින් මෙන්ම මූලික තොරතුරු සපයන්නන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා තුළින් තහවුරු කර ගැණිනි. වී මිලදී ගැනිමේ රාජ්‍ය ප්‍රතිපත්තියේ පවතින ගැටලු රාශියක් අධ්‍යයනයෙන් අනාවරණය විය. ඒ අතර ප්‍රධාන වශයෙන් වී අලෙවි කිරීම සම්බන්ධ ජනතාවට නියමකරගත් එක් මිලක් යටතට පත් කළත් ඒ යටතට හසුවන ගොවීන් සංඛ්‍යාව ඉතා සුළු ප්‍රමාණයකි (39%). විශේෂයෙන්ම ඒ සඳහා බලපෑ ප්‍රධාන හේතු දෙකකි. ඉන් පළමුවැන්න වන්නේ ගොවින්ගෙන් ලබා ගන්නා වී ප්‍රමාණය කිලෝග්‍රෑම් දෙදහසකට සීමා කිරීමයි. අනෙක නම් ගොවීන් කිලෝග්‍රෑම් දෙදහසකට වඩා වැඩි ප්‍රමාණයක් රජයට අලෙවි කිරීමයි. ඒ තුළින් බහුතර ගොවීන් පිරිසකට රජයට වී අලෙවිකිරීමේ අවස්ථාව අහිමි වී ඇත. එමෙන්ම ගබඩා පහසුකම් නොමැතිවීම වැනි ගැටලු (66.6%) නිසා වී මිලදී ගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය තුළ සමාන ඉඩ ප්‍රස්ථා ගොවීන්ට නොමැති බව හඳුනා ගත හැකිය.

ප්‍රමුඛ පදඃ වී මිලදී ගැනීම, රාජ්‍ය ප්‍රතිපත්තිය, පොළොන්නරුව දිස්ත්‍රික්කය, ගොවීන්

1  ජනසංනිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

2 *කථිකාචාර්ය,* ,ජනසංනිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය